# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION


සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1254 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 05/10/2023 පැය 1440

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විවිධ පහන් හා අමතර කොටස් සවිකර ධාවනය කරනු ලබන බස් රථ පරීක්ෂා කිරීම - මාධ්‍ය ආවරණය සඳහා ආරාධනයයි**

විවිධ පහන් හා අමතර කොටස් සවි කර අලංකරණය කර මාර්ගයේ ධාවනය කරනු ලබන බස් රථ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ප්‍රචාරය වීමෙන් පසු 2023.10.02 වන දින එවැනි බස් රථ මරදාන ට්‍රිපෝලි ආයතන භූමිය වෙත කැඳවා පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව බස් රථ 25ක් සඳහා ධාවනය තහනම් කිරීමට නියෝග ලබා ගෙන ඇත.

මෙම පරීක්ෂාවේ දෙවන අදියර ලෙස 2023.10.02 වන දින නොපැමිණි බස් රථ පරීක්ෂා කිරීම 2023.10.06 වන දින පෙරවරු 10.00 ට පිටකොටුව, බැස්ටියන් මාවත මැනිං වෙළඳපල භූමියේදී සිදු කිරීමට නියමිතය. **මෙහිදී බස් රථ පරීක්ෂා කර අදාල තහනම් නියෝග ලබා දීමට කටයුතු කරන අතර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් තුමා, නියෝජ්‍ය පොලිස්පති රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව ඇතුළු කණ්ඩායමක් මෙම බස් රථ පරීක්ෂාවට සහභාගී වීමට නියමිතව ඇත.**

මෙම අවස්ථාව ආවරණය කිරීම සඳහා ඔබ මාධ්‍ය ආයතනයේ නියෝජිත මහත්ම, මහත්මීන් ඉහත සඳහන් ස්ථානයට සහභාගි කරවීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**